# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,368 — 1924ක්වූ ජනවාරි මස 4වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 2,705, C. P.**—මධ්‍යම දිසාවේ මාතලේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1924ක්වූ පෙබරවාරි මස 14වෙනි දිනවූ බෘහස්පතින්දා දවල් 1·30ට මාතලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණනන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ මාතලේ දකුණු සහ උතුරු කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 39ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | මුල් සිතියම 7,169. ගම—මාතලාපිටිය. අයිතිකම්කියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 1 | මුරුන්ගාගහමූලහේන | යූ. පුන්චා | හේන | 1 | 2 | 38 | 40 |
| | මුල් සිතියම 7,512. | | | | | | |
| 1 | ගල්ඇනමුල්ලේහේන | නයිදෑ වෙල්දේවයා | හේන | 2 | 1 | 8 | 40 |
| | මුල් සිතියම 7,394. | | | | | | |
| 1 | කැතිගාතාමඩහේන | ජී. සිල්වා සහ තවත් කෙනෙක් | හේන | 0 | 0 | 11 | 40 |
| 2 | එම | එම | පොල්පැල තිබේ | 0 | 0 | 5 | 75 |
| 3 | එම | එම | එම | 0 | 2 | 10 | 75 |
| 4 | එම | එම | හේන | 0 | 0 | 23 | 40 |
| 6 | එම | එම | එම | 0 | 1 | 26 | 40 |
| | මුල් සිතියම 7,189. ගම—උඩස්ගිරිය. | | | | | | |
| 5 | අස්වැද්දුමපිල්ලාව නොහොත් අස්වැද්දුමේහේන | — | රබර් සහ පොල්පැල තිබේ | 0 | 1 | 11 | 40 |
| 8 | නුගමුල්ලෙල්ලන්දේහේන | ජී. ලපයා | පොල්, රබර් සහ ජයපාල පැල තිබේ | 0 | 2 | 28 | 40 |
| | මුල් සිතියම 7,493. | | | | | | |
| 1 | බැලුන්ගලහේන | ජේ. පෙරේරා | හේන ජයපාල සහ රබර්පැල තිබේ | 2 | 0 | 29 | 120 |
| | මුල් සිතියම 7,017. | | | | | | |
| 1 | ගල්ගොඩෙහේන නොහොත් දෙමටගහපිටියේහේන | ජේ. පෙරේරා | රබර්පැල තිබේ | 2 | 0 | 38 | 120 |
| 2 | එම | — | එම | 0 | 0 | 17 | —* |
| 3 | එම | ජේ. පෙරේරා | එම | 0 | 1 | 11 | 120 |
| 4 | එම | එම | මුඩුබිම | 0 | 0 | 5 | —* |
| | මුල් සිතියම 6,963. | | | | | | |
| 1 | ගොරෙක්ගහහේන | — | රබර්පැල තිබේ | 0 | 0 | 9 | —* |
| 2 | එම | ජේ. පෙරේරා | එම | 5 | 2 | 25 | 120 |
| 3 | දුනුමඩලගහමූලහේන | — | එම (සොහොන්භූමිය) | 0 | 1 | 5 | —* |
| 4 | එම | — | එම | 0 | 0 | 12 | —* |
| 5 | එම | — | එම | 0 | 0 | 21 | —* |
| 6 | ගොරෙක්ගහහේන | — | රබර්පැල තිබේ | 0 | 0 | 2 | —* |
| 7 | එම | ජේ. පෙරේරා | එම | 0 | 0 | 30 | 120 |
| 8 | තෙලඹුගලේහේන | — | එම | 0 | 1 | 27 | 120 |
| 9 | ගොරෙක්ගහහේන | — | එම | 0 | 0 | 7 | —* |
| 10 | එම | — | පැලක් තිබේ | 0 | 0 | 18 | —* |
| | මුල් සිතියම 6,994. ගම—යටවත්ත. | | | | | | |
| 1 | එගොඩලන්දේහේන | ආර්. බී. යටවර | පොල්පැල තිබේ | 3 | 3 | 31 | 50 |
| 4 | කුඹල්කුඹුරේපිල්ලාව | — | මුඩුබිම | 0 | 0 | 9 | 50 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | මුල් සිතියම 7,398. ගම—කොබ්බෑවැහැර. | | | | | | |
| 1 | තෙලඹුගහකුඹුරේපිල්ලාව | කිරිබන්ඩා | වත්ත | 0 | 1 | 10 | 30 |
| | මුල් සිතියම 7,335. ගම—කොහොලන්වෙල. | | | | | | |
| 1 | නිකලන්දේයාය සහ යබර ගල්ගොඩේහේන | එ. පෙරේරා | හේන | 0 | 0 | 20 | 25 |
| 2 | එම | එම | එම | 3 | 1 | 19 | 25 |
| 3 | එම | එම | එම | 2 | 1 | 16 | 25 |
| | මුල් සිතියම 7,469. | | | | | | |
| 1 | ගල්ලිඳේමූකලාන | ඇම්. බන්ඩා සහ තවත් | මූකලාන | 4 | 0 | 0 | 40 |
| 2 | එම | — | එම | 1 | 1 | 18 | —* |
| | මුල් සිතියම 7,549. ගම—පරනගම. | | | | | | |
| 1 | පල්ලේගෙදරවත්ත | ජී. අප්පුහාමි | පොල්වත්ත | 1 | 0 | 1 | 30 |
| 2 | එම | එම | එම | 0 | 3 | 14 | 30* |
| 3 | මැටිබුම්බියේහේන | — | හේන | 0 | 0 | 6 | —* |
| 4 | එම | ජී. අප්පුහාමි | පොල්වත්ත | 1 | 2 | 5 | 30 |
| | මුල් සිතියම 7,551. ගම—පොරෝකාරගම. | | | | | | |
| 1 | පොල්ගස්කනත්තේහේන | පී. පුන්චිරාල | හේන | 1 | 0 | 23 | 30 |
| 2 | එම | — | එම | 0 | 0 | 26 | —* |
| | මුල් සිතියම 7,550. | | | | | | |
| 1 | බදුල්ලගහමුල්ලේහේන | ඒ. උක්කුබන්ඩා | පොල්පැලහේන | 1 | 0 | 38 | 20 |

* ඉතුරුකරතිබේ. විකුණනුනොලැබේ.

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණා මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්‍ෂ 1923ක්වූ දෙසැම්බර් මස 21වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලෑමැන්ටි,
මහසෙක්‍රතාරිස් වම්භ.

---

**No. 4,090, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1924ක්වූ පෙබරවාරි මස 21වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1කට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් නිශ්චයකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තොට වලල්ලාවිටිකෝරළේ සහ වැල්ලබඩපත්තුවේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම් කැබලි 14ක්.

මුල් සිතියම 12,120. ගම—මාගල උතුර බෙන්තර වලල්ලාවිටිකෝරළේ. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගොන්ගලබොක්කෙ මානාන | දකුණු මාගල පදිංචි තොම්මියාහකුරු හරුමානිස් | වත්ත | 0 | 2 | 16 | 60 |
| 2 | එම | එම | පතන | 0 | 3 | 39 | 60 |
| | ගම—මාගල දකුණ වැල්ලබඩපත්තුවෙ. අයිතිකමකියන්නා—මාගල දකුණේ පදිංචි ඩබ්ලිව්. අර්නෝලිස් මැන්දිස් පොලිස් මූලාදෑනියා. | | | | | | |
| 3 | ගොන්ගල්උඩුමුල්ලගහකුඹුර | දකුණු මාගල පදිංචි තොම්මියාගකුරු හරුමානිස් | කුඹුර | 0 | 0 | 26 | 126 |
| 4 | බඹරවෙල්කැටිය | ඩබ්ලිව්. අර්නෝලිස් මැන්දිස් දකුණු මාගල | එම | 3 | 0 | 5 | 126 |
| | අයිතිකමකියන්නා—මාගල දකුණ පදිංචි මුවේගොඩහකුරු සර්නේලිස්. | | | | | | |
| 5 | එම | ඩබ්ලිව්. අර්නෝලිස් මැන්දිස් දකුණු මාගල | කුඹුර | 0 | 3 | 0 | 126 |
| | මුල් සිතියම 11,826. ගම—ගෝනගල බෙන්තර වලල්ලාවිටිකෝරළේ. අයිතිකමකියන්නා—දොන් සියදෝරිස් විජේවර්ධන. | | | | | | |
| 23 | කපුහෙන් උඩුමුල්ල | ගෝනගල පදිංචි ඩී. ඒ. විජේසිංහ | වත්ත | 0 | 0 | 9·4 | 80 |
| | | | වැවිල්ල | — | | | 8·40 |
| | මුල් සිතියම 11,971. ගම—මාගල උතුර. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 3 | හල්ගහවෙලමානාන | මාගල උතුරෙ පදිංචි ඉලන්දරිදේව සිදුරිස් | පතන | 0 | 2 | 35 | 250* |
| | මුල් සිතියම 12,072. ගම—උඩුමුල්ල නොහොත් මානානෙ උඩුමුල්ල. | | | | | | |
| 1 | ඉනනකුරුගොඩකැලේ | ඉදුරුවෙ පදිංචි ගෝනගල සිඤ්ඤෝ අප්පුහාමි අමරසූරිය | බැද්ද | 3 | 0 | 27 | 80 |
| | මුල් සිතියම 12,092. ගම—නාරන්ඕවිට. අයිතිකමකියන්නා—(1) ඇම්. අබිරිස, (2) උදුරිස් ද සිල්වා. | | | | | | |
| 3 | බලගලවෙල නොහොත් බල ගල දෙනිය | බලපිටියෙ පදිංචි මර්තේනිස් ද සිල්වා රූපසිංහ | කුඹුර | 4 | 1 | 1 | 56 |
| | මුල් සිතියම 12,286. ගම—ගාලුවමුල්ල. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 1 | කටුකනත්තෙ මානාන නොහොත් කිරි පැල්ල ගහ මානාන | ගාලුවමුල්ලෙ පදිංචි ගොලුවමුල්ලේ සීලානන්ද තෙරුන්නාන්සේ | කැකිල්ල | 1 | 3 | 22 | 60 |
| 2 | එම | එම | එම | 2 | 2 | 26 | 60 |
| | අයිතිකමකියන්නා—ඕ. කේ. පුංචිසිඤ්ඤෝ. | | | | | | |
| 3 | මිල්ලගහගොඩ | ගාලුවමුල්ලේ පදිංචි ගොලුවමුල්ලේ සීලානන්ද තෙරුන්නාන්සේ | වත්ත | 0 | 0 | 28 | 60 |
| | | | වැවිල්ල | — | | | 4·25 |
| | අයිතිකමකියන්නා—(1) පොඩිනන්, (2) විලියම්, (3) ලූයිස්, (4) ඔවිනිස්. | | | | | | |
| 4 | මිල්ලගහගොඩදූව | ගොලුවමුල්ලෙ පදිංචි ගොලුවමුල්ලේ සීලානන්ද තෙරුන්නාන්සේ | වත්ත | 0 | 3 | 36 | 60 |

| නො. | ඉඩමේනම, | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | මුල් සිතියම 12,309. ගම—බේරතුඩුව, අයිතිකමකියන්නා—(1) ඇම්. සුරප්පු, (2) ඞී. සී. ගුණවර්ධන, (3) ජී. හර්මානිස්, (4) ජී. ලමාරිස්. | | | | |
| 1 | ගුරුකන්ද වත්ත අද්දර කඩොල්ල | බේරතුඩුවෙ පදිංචි ඇම්. එච්. ඉංගෙරිස් අප්පු .. | කුඹුර .. | 0 3 29 | 60 |
| 2 | එම .. | එම .. | .. සුලුබැද්ද .. | — | —† |

* මිනිරන්හෑරීමේ බලය ඇතුව අක්කරයක මිල    † (විකිනීමට නොවේ) ආණ්ඩුව අයිතිකම් නොකියන ඉඩම.

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණ ගාල්ලේ මහා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1924ක්වූ ජනවාරි මස 3වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලෑමැන්ටි,
මහලේකම්තාරිස් වම්භ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පලාතොට වෙඩිබෙහෙත්ගෙට යෑමට පාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැන්ම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 18,269. ගම—පලාතොට.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | — .. | අවුරුදු 20ක පොල්ගහක් අඩංගු පාර .. | චාර්ල්ස් ජෑන්ස් .. | 0 0 6·3 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1924ක්වූ පෙබරවාරි මස 18වෙනි දින පෙරවරු 10යේ කනිසමට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1923ක්වූ දෙසැම්බර් මස 22වෙනි දින කළුතර කච්චේරියේදීය.

එච්. ඒ. බර්ඩන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්භ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ප්‍රසිද්ධ වැඩ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කුලීලැයිම් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 7,582. ගම—තලවකැලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සැන්ට් ක්ලෙයාර්වත්ත .. | කුලීලැයිම් යනාදිය සීමා සහිත | රයන් (ලංකාවේ) වතු සමාගම .. | 0 0 24·8 |
| | | ඇතුළු වත්ත | | |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1924ක්වූ ජනවාරි මස 28වෙනි දින උදේ දහයේ කනිසමට නුවරඑළියේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1923ක්වූ දෙසැම්බර් මස 22වෙනි දින නුවරඑළියේ කච්චේරියේදීය.

ජී. ටී. ඩයිසන්,
ආණ්ඩුවේ උපඒජන්ත වම්භ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—සොහොන්භූමියක් පිහිටවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 11,138. ගම—දික්වැල්ල (මොහම්මත්කාර).

| නො. | ඉඩමේ නම, | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මරක්කලමහත්මයා පදිංචිව හිටියවත්ත | පොල්වත්ත | (1) යූසුප්ලෙබ්බෙ මරික්කාර් මුහම්මදුඅලි මරික්කාර් (2) ඒ. ඇල්. ඇම්. නොතාරිස් අබ්දුල් රහිමන්, (3) ඕ. ඇම්. ඇස්. අබ්දුල් මජීදු, (4) ඒ ඇල්. සාවල් හමීදු සහ තවත් අය | 1 1 23·9 |
| 2 | එම .. | අඹිපාර .. | එම .. .. .. | 0 0 3·6 |
| 3 | අලියන්තෝට්ටම් .. | පොල්වත්ත | එම .. .. .. | 0 0 2 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1924ක්වූ ජනවාරි මස 26වෙනි දින පෙරවරු 10යේ කනිසමට දික්වැල්ලේ නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1923ක්වූ දෙසැම්බර් මස 21වෙනි දින මාතර කච්චේරියේදීය.

ජී. ඇස්. වුඩ්මන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්භ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දූ කොඨාසයේ පිහිටි නාරන්තනගෙන යන ගමට සුලුපාරක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මනත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 5,976. ගම—නාරන්තනගෙන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මිලන්ඩු .. | සුලුපාර .. | නැසීගිය කේ. සින්නකුට්ටිගේ භාර්‍යාව වන මංකලම් .. | 0 0 9 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්ට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1924ක්වූ ජනවාරි මස 30වෙනි දින පෙරවරු 10යේ කාලයට යාපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1923ක්වූ දෙසැම්බර් මස 12වෙනි
යාපනේ කච්චේරියේදිය.

ඇල්. ඩබ්ලිව්. සී. සරඩර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්ශ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[කොළඹ දැන්වීම නො. 8,496.]

වර්ෂ 1897යේ, 1899යේ 1900යේ සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රාකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1924ක්වූ ජනවාරි මස 4වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත කොළඹ කච්චේරියට ඇවිත් බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩමට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම තමන් හෝ ලියවිල්ලකින් කියා නොසිටියොත් එකී ඒජන්ත උන්නාන්සේ විසින් ඉහතකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබී තිබෙන බලපූර්වන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම රජසන්තක ඉඩමක් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

පී. සරවනමුත්තු,
කොළඹ දිස්ත්‍රික්කේ අතිරේක ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ.

මෙහි සඳහන් ඉඩම මැදින් වැටීතිබෙන යම් පාරකට අයිතිවාසිකම් කියා සිටීම, එකී ඉඩමට අයිතිවාසිකම් කියාසිටීම හා සමානබව සැලකිය යුතුයි.

කියන්නේ මේ ඉඩම ගැණයි.

මීට යාකරණලද සිතියමේ* පෙණෙන බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කුවේ, සල්පිටිකෝරළේ, පල්ලේපත්තුවේ හල්පිට යන ගම පිහිටා තිබෙන බිම්කට්ටිය:—

මූල් සිතියම නො. 18,138.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 6 .. | හල්පිටවැව (වැව) .. .. .. .. | 0 0 35 |
| 7 .. | එම .. .. .. .. .. | 0 0 5 |
| | | 0 1 0 |

මෙහි පහත සඳහන්වූ මායිම්—උතුරට ආර්. සුසේඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින වැවකුඹුර; නැගෙනහිරට ආර්. සුසේඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින වැවකුඹුර සහ යූ. ජොගෝනිස්අප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින රදාගේකුඹුර; දකුණට යූ. ජොගෝනිස් සහ තවත් අය විසින් අයිතිකම්කියාසිටින රදාගේකුඹුර සහ පී. ආයිරිස් සහ පී. දොන් අල්ලිස් විසින් අයිතිකම්කියාසිටින නාගහලන්ද; බස්නාහිරට පී. දොන් මායිරිස් විසින් අයිතිකම් කියාසිටින ගොඩපොරගහලන්ද (මූ. සි. 8,446/F480), සහ ආණ්ඩුව විසින් අයිතිකම්කියාසිටින නාගහලන්ද (මූ. සි. 18,138/2).

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 6වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

[මහනුවර දැන්වීම නො. 8,497.]

වර්ෂ 1897යේ, 1899යේ 1900යේ සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇතිකෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1924ක්වූ ජනවාරි මස 4වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මහනුවර කච්චේරියට ඇවිත් මධ්‍යම දිසාවේ මහනුවර පළාතේ උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩම්වලට නොහොත් එය ඉඩමකින් හෝ ඊට වැඩිගණනකින් තිබෙන අයිතිකම් නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කියා නොසිටියොත් එකී උප ඒජන්ත උන්නාන්සේ විසින් එකී ආඥාපණතෙන් උන්නාන්සේට ලැබීතිබෙන බලපූර්වන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් නොහොත් එයින් යම් ප්‍රමාණයක් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

ඒ. ඇන්. හච්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්ශ.

මෙකී ඉඩමක් හෝ ඉඩම් උඩින් යන මාවතකට තිබෙන අයිතිවාසිකම ඒ ඉඩම හෝ ඉඩම් සම්බන්ධව තිබෙන වැදගත්කමකි.

කියන්නේ මේ ඉඩම් ගැනයි.

මීට යාකර තිබෙන සිතියමේ* විස්තරකර තිබෙන ප්‍රකාර මධ්‍යම දිසාවේ මහනුවර පළාතේ තුම්පනේ කොට්ඨාසයේ උඩපලාත කෝරළේ ගිරිහාගම පාලුකෝපිවත්ත යන ගමේ තිබෙන මෙහි පහත පෙණෙන බිම්කැබෙලිය.

මූල් සිතියමේ නො. 7,121.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 3 | ඇටඹගහමුලතැන්න .. .. | 4 3 32 | 6 | පාළුකෝපිවත්ත .. .. | 20 3 13 |
| 4 | ඇටඹගහමුලතැන්න (ඇලට තහනම් කැබෙල්ල) .. .. | 1 1 4 | 8 | පාළුකෝපිවත්ත (ඇලට තහනම්කර තිබෙන කැබෙල්ල) .. .. | 0 0 20 |
| 5 | ඇටඹගහමුලතැන්න .. .. | 8 0 1 | 15 | පාළුකෝපිවත්ත .. .. | 0 1 20 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 7වෙනි පිටේ ප්ලෑනය බලනු.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 16 | පාළුකෝපිවත්ත .. .. | 0 | 0 | 38 |
| 20 | එම .. .. | 26 | 1 | 29 |
| 24 | එම .. .. | 50 | 0 | 22 |
| 25 | එම .. .. | 11 | 0 | 37 |
| 43 | පාළුකෝපිවත්ත (ඇලට තහනම්කර තිබෙන කැබැල්ල) .. .. | 2 | 0 | 18 |
| 44 | පාළුකෝපිවත්ත .. .. | 7 | 2 | 2 |
| 45 | එම .. .. | 0 | 2 | 24 |
| | | 133 | 3 | 20 |

මීට මායිම්—උතුරට මඩවල ගමේ මායිම කෙරවල්ද; නැගෙණහිරට සහ දකුණට හාරිස්පත්තු කොට්ඨාසයේ මායිම් කෙරවල්ද; බස්නාහිරට ආණ්ඩුවෙන් අයිතිවාසිකම් නොකියන පාළුකෝපිවත්ත යන ඉඩමය (7,121 මුල් සිතියමේ නො. 19 කැබැල්ල), පිටඇල, ආණ්ඩුවෙන් අයිතිකම් නොකියන පාලුකෝපිවත්ත (නො. 7,121 මුල් සිතියමේ 18 කැබැල්ල), දික්ඔය, අයිතිවාසිකමේ සිතියමේ නො. 348,241, නො. 163,911, 159,212, 155,309 දරණ අයිතිකම් සිතියම්, අයිතිවාසිකමේ සිතියමේ නො. 348,240 මලදෙල, නො. 232,193 අයිතිවාසිකමේ සිතියම, පාලුකෝපිවත්ත (ආණ්ඩුව අයිතිකම් නොකියන මුල් සිතියමේ 7,121 නො. 13 කැබැල්ල), ආණ්ඩුව අයිතිකම් නොකියන පාලුකෝපිවත්ත (මුල් සිතියමේ 7,121 නො. 12 කැබැල්ල), නො. 156,251, 156,245 අයිතිවාසිකමේ සිතියම්, අයිතිවාසිකමේ සිතියමේ නො. 348,239, ආණ්ඩුව අයිතිකම් නොකියන පාලුකෝපිවත්ත (නො. 7,121 මුල් සිතියමේ 10 කැබෙල්ල), අයිතිවාසිකමේ සිතියමේ නො. 348,796, බෙරවබුඇල, අයිතිවාසිකමේ නො. 156,254 සිතියම, ආණ්ඩුව අයිතිකම් නොකියන පාලුකෝපිවත්ත (මුල් සිතියමේ නො. 7,121 නො. 7 කැබැල්ල සහ මඩවල ගමේ මායිම් කෙරවල්ද.

සිහිකටයුතු කරුණ:—ඉහල සඳහන්වූ මායිම්තුල තිබෙන මෙහි පහත සඳහන්වෙන කැබෙලි නොතීසියේ මේ කොට්ඨාසයෙන් අත්ඇරිය, ඒ ඇරත් ඒ කැබෙලිවලට තවත් අයිතිවාසිකම් නොකියනවාත් ඇර ඒවා ඉහල පෙනෙන අක්කර ප්‍රමාණයවූ අක්කර 133කුත් රූඩ් 3කුත් පර්චස් 20ට අඩංගුකර නැත.

මුල් සිතියමේ නො. 7,121.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 21 .. | පාලුකෝපිවත්ත (ආණ්ඩුව විසින් අයිතිකම් නොකියන ඉඩම) .. .. .. | — | | |
| 22 .. | එම ( එම ) .. .. .. | — | | |
| 23 .. | එම ( එම ) .. .. .. | — | | |
| — .. | අයිතිවාසිකමේ සිතියමේ නො. 156,417 .. .. .. | 0 | 1 | 13 |
| — .. | එම 157,485 .. .. .. | 0 | 1 | 5 |
| | | 0 | 2 | 18 |

[මහනුවර දූත්වීම නො. 8,498.]

වර්ෂ 1897කේ, 1899යේ, 1900යේ සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1924ක්වූ ජනවාරි මස 4වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මහනුවර කච්චේරියට ඇවිත් ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩම්වලට නොහොත් එය ඉඩමකින් හෝ ඊට වැඩිගණනකින් තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කියා නොසිටියහොත් එකී උප ඒජන්ත උන්නාන්සේ විසින් එකී ආඥාපණතෙන් උන්නාන්සේට ලැබීතිබෙන බලපූර්වත් කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් නොහොත් එයින් යම් ප්‍රමාණයක් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

ඒ. ඇන්. හව්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

මෙකී ඉඩමක් හෝ ඉඩම් උඩින් යන යම් මාවතකට තිබෙන අයිතිවාසිකම ඒ ඉඩම හෝ ඉඩම් සම්බන්ධව තිබෙන වැදගත්කමකි.

කියන්නේ මේ ඉඩම් ගැණයි.

මීට යාකර තිබෙන සිතියමේ* විස්තරකර තිබෙන ප්‍රකාර මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ හාරිස්පත්තු කොට්ඨාසයේ මැදසියපත්තු කෝරළේ ගිරිහාගම යන ගමේ තිබෙන මෙහි පහත පෙනෙන බිම්කැබෙලිය:—

මූල් සිතියමේ නො. 7,121.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 26 | පාළුකෝපිවත්ත .. .. | 10 | 1 | 25 |
| 27 | එම .. .. | 0 | 1 | 20 |
| 36 | එම .. .. | 2 | 3 | 36 |
| 37 | එම .. .. | 8 | 0 | 32 |
| 38 | එම .. .. | 15 | 3 | 0 |
| 39 | පාළුකෝපිවත්ත .. .. | 0 | 1 | 33 |
| 41 | එම .. .. | 0 | 1 | 20 |
| | | 38 | 2 | 6 |

මීට මායිම්—උතුරට උඩපලාතකෝරළේ මායිම් කෙරවල්ද; නැගෙණහිරට අයිතිවාසිකමේ සිතියම් නො. 53,948, 339,505, 173,071 මලදෙල, පාලුකෝපිවත්ත යන අඩිපාරට තහනම් කැබෙල්ල (6,288 මුල් සිතියමේ 1,128 කැබෙල්ල) සහ අයිතිවාසිකමේ සිතියමේ නො. 49,687; දකුණට ආර්. ඇම්. ලොකුබන්ඩා සහ වෙනත් අයිතිවාසිකම්කියන කිරීවනාවේහේනද; බස්නාහිරට දික්ඔය, ආණ්ඩුව අයිතිකම්නොකියන පාලුකෝපිවත්ත යන ඉඩම (මුල් සිතියමේ 7,121 නො. 42 කැබෙල්ල), 162,137 අයිතිවාසිකමේ සිතියමද, ආණ්ඩුව අයිතිකම්නොකියන පාලුකෝපිවත්ත ඉඩමද (මුල් සිතියමේ 7,121යේ නො. 40 කැබෙල්ල), මලදෙල, රජ්ගම්මනඇල සහ උඩපලාතකෝරලයේ මායිම් කෙරවල්ද.

සිහිකටයුතු කරුණ:—ඉහල සඳහන්වූ මායිම්තුළ තිබෙන මෙහි පහත පෙණෙන කැබෙලි නොතිසියේ මේ කොට්ඨාසයෙන් අත්ඇරය, ඒ ඇරත් ඒවායේ එකතුවූ මුල් ප්‍රමාණය අක්කර 2කුත් පර්චස් 29ය වන ප්‍රමාණය, මීට ඉහතින් පෙණෙන අක්කර 38කුත් රූඩ් 2කුත් පර්චස් 6යේ ප්‍රමාණයට අඩංගුකර නැත.

මුල් සිතියම 7,121.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 28 | පාළුකෝපිවත්ත (ආණ්ඩුව විසින් අයිතිකම් නොකියන ඉඩම) .. .. | — | | |
| 31 | පාළුකෝපිවත්ත (අඩිපාරට ඉතුරුකරතිබේ) | 0 | 0 | 5 |
| 35 | පාළුකෝපිවත්ත (ආණ්ඩුව විසින් අයිතිකම් නොකියන ඉඩම) .. .. | — | | |
| — | T. P. 154,646 .. .. | 1 | 0 | 30 |
| — | T. P. 181,568 .. .. | 0 | 1 | 13 |
| 29 | T. P. 349,165 .. .. | 0 | 0 | 4 |
| 30 | එම .. .. | 0 | 0 | 18 |
| 32 | එම .. .. | 0 | 0 | 10 |
| 33 | එම .. .. | 0 | 0 | 11 |
| 34 | එම .. .. | 0 | 1 | 18 |
| | | 2 | 0 | 29 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 8නවනි සිටේ ප්ලෑනය බලනු.

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම්.

"පුත්තලමට ලුණු ගෙනගොස් කිරා බාරදීමට ටැන්ඩරයයි" පිටකොළේ ලියා වසනලද ඉල්ලුම්පත්‍ර පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1924ක්වූ ජනවාරි මස 22වෙනි දින දවල් 1ක වනතුරු ඉල්ලන්ට සතුටු අයගෙන් බාරගනු ලැබේ.

එනම්: වර්ෂ 1923න් මාස් මෝසමේදී එකතුකළ ලුණු පළමුවෙන් තිලයඩි අලමේ සිටද නැවත බස්නාහිර සහ නැගෙනහිර අලම්වලින්ද ගෙනගොස් පළමුව, කිරා පුත්තලමේ ලුණු ගබඩාවල තැන්පත්කිරීමටද, දෙවනුව පුත්තලමේ නැගෙනහිර ලුණු අලමේ ලුණු ගොඩකිරීමට සාදා තිබෙන ස්ථානයට ගෙනයාමයයි වෙන් වෙන් වශයෙන් දැනගත යුතුයි.

ඉල්ලුම්කාරයන් විසින් මෙහි පහත සඳහන්කරණලද උවමනා සිතට ගතයුතුයි.

1. ඉල්ලුම්කාරයන් විසින් ගෝනිවලට දමා කට බැඳ තිබෙනනාවූ ලුණු හොන්ඩර 1,000ක්ගෙනයාමට ගණන්දෙකක් කිරා ගුදම්වල තැන්පත්කිරීමටද එක ගණනක් ලුණු ගොඩගැසීමට සාදා තිබෙන ස්ථානයේ ගේට්ටු ලඟදී ට්‍රොලිවලට බාරදීමටද වෙන් වශයෙන් සඳහන්කළ යුතුයි.

2. ඉල්ලුම්කාරයා ($a$) යෝජනාවේ ප්‍රකාර දවසකට හොන්ඩර 1,450ක් ගෙනගොස් කිරා ගුදම්වලට බාරදෙන්ට ඕනෑය. ($b$) යෝජනාවේ ප්‍රකාර දවසකට හොන්ඩර 1,600ක් ලුණු ගොඩගැසීමට සාදා තිබෙන ස්ථානයට (ප්ලැට්ෆෝර්ම්) ගෙනයන්ට ඕනෑය. ඉල්ලුම්කාරයා මෙයාකාරයෙන් වැඩනොකර පැහැර ඇරියොත් දවසකට රුපියල් 10කට වැඩිනොවන දඩයක් පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත පිට තීන්දුකරණවා ඇත.

3. ($a$) යෝජනාවේ ප්‍රකාර වැඩේ වර්ෂ 1924ක්වූ පෙබරවාරි මස 1වෙනි දින පටන්ගන්ටද, ($b$) යෝජනාවේ ප්‍රකාර 1924ක්වූ මාර්තු මස 1වෙනිදා පටන්ගන්ටද ඕනෑය.

4. ඉල්ලුපත්‍රය දැමීමට මත්තෙන් ඉල්ලුම්කාරයා කොළඹ ට්‍රෙෂරියේ හෝ ඕනෑම කච්චේරියක රුපියල් 200ක් බඳින්ට ඕනෑය. එසේ නොබැන්දාවූ ඉල්ලුම්කාරයාගේ ඉල්ලීම කල්පනාවට නොගනිති. කොන්ත්‍රාත්තුවට බැඳීමට ඉල්ලුම්කාරයා සූදානම්ව නොසිටියොත් නොහොත් කොන්ත්‍රාත්තුවේ වැඩේ නිසිසේ කිරීමට රුපියල් 1,000ක සහතික ඇප දීමට ඔහුට පුළුවන් නූනොත් එකී මුදල ආණ්ඩුවට තහනම්වේ. තහනම්කරණු නොලැබූ මුදල ඉල්ලුම්කාරයින්ට ආපසු දෙනුලැබේ.

5. ඉල්ලුම්කාරයින්ට ලියුම් නොහොත් නොතිසි බාරදීමට පුත්තලමේ ස්ථානයක් ඉල්ලුම්කාරයින් විසින් නියමකළයුතුයි.

6, කොන්ත්‍රාත්තුවේ වැඩ නිසිසේ කරදීමට වගකියන්ට බැඳෙන්නාවූ ඇපකාරයින් දෙදෙනෙකුගේ නම ගම දරන ඔවුන්ගේ අත්සන් තබා ලියමනක් ඉල්ලුම්පත්‍රය හා සමග තිබෙන්ට ඕනෑය.

7. ඉල්ලුම්කාරයා විසින් සටහන්කළ ඉල්ලීමේ ගණන් ආපසු පත්‍රයේ වෙනස්කළොත් එතැන්හි ඔහුගේ අත්සනේ මුල් අකුරු සටහන්වී තිබෙන්ට ඕනෑය.

8. ඉල්ලුම්පත්‍රය උප ඒජන්ත උන්නාන්සේට යවන්නාවූ වේලාවටම එහි පිටපතක් ඉල්ලුම්කාරයා විසින් තැපෑලෙන් කොළඹ ගරුකටයුතු ආදායම් පරීක්ෂක උන්නාන්සේට එම දවසේම යැවියයුතුයි.

9. ඉල්ලුම්පත්‍ර ඇරලාබලන දවසට ඉල්ලුම්කාරයෝ කච්චේරියේ සිටියයුතුයි.

10. නිසියාකාර කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට යන අය කොන්ත්‍රාත්තුවේ ලියකියමන් සඳහා යම් මුදලක් ආණ්ඩුවේ පෙරකදෝරු උන්නැහෙට ගෙවන්ට උනොත් එයද ගෙවිය යුතුයි.

11. කරත්තවලට ලුණු පටවන්ට පෙර කොටුවලදීම ගෝනිවලට ලුණු දමා කටවල් බඳින්ට ඕනෑය.

12. තනියම හෝ තව අයෙක් සමග හවුලේ හෝ බැඳීසිටියාවූ යම් ආණ්ඩුවේ කොන්ත්‍රාත්තුවක් කඩකිරීමේ වරදකාරයෙක් හැටියට ලැයිස්තුවේ නම පෙනෙන අයෙකුගේ ඉල්ලීම් පත්‍රය පිළිගනු නොලැබේ. ඉල්ලුම්කාරයා විසින් ඉහතකී අන්දමේ කෙනෙකුන්ට හෝ පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් සෑහේය කියා පෙනීයන්නාවූ කාරණවල් උදෙසා ලියවිල්ලකින් නිසි අන්දමට දැනුම්දී පිළිනොගත්තාවූ කෙනෙකුන්ට ඇටෝර්නි බලයක් දෙන්ට යුතුනැත.

13. මේ වැඩය සඳහා යම් වැඩිමනත් දැනගැනීමක් උවමනා කරණ ඉල්ලුම්කරුවන් කච්චේරියෙන් ඉල්ලුම්කරන්ට ඕනෑය.

14. ලියවිල්ලකින් මාසයක් කල්දී කොන්ත්‍රාත්කාරයාගේ කොන්ත්‍රාත්තුව අස්කිරීමට පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේට බලය තිබෙන බවද දැනගතයුතුයි.

15. ඉහළ සඳහන්කරනලද නියෝග සියල්ලම යම් ඉල්ලුම්පත්‍රයක් ගැන හරියාකාර සම්පූර්ණකර තිබුණොත් මිස නැත්නම් එය කල්පනාකරනු නොලැබේ.

16. පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගෙන් අවසරයක් නැතුව කොන්ත්‍රාත්තුව යම් කෙනෙකුට ලියාදෙන්ට හෝ දෙවනු කුලියට නොහොත් බද්දට දෙන්ට නුපුළුවන.

17. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර හෝ කිසි ප්‍රශ්නයක් නැතුව බාරනොගන්ට අයිතිවාසිකම සහ ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් බාරගන්ට අයිතිවාසිකමද ආණ්ඩුවට තබාගත්තා ඇත.

ඩබ්ලිව්. කේ. එච්. කැම්බල්,
උප ඒජන්ත උන්නාන්සේ වම්හ.

වර්ෂ 1923ක්වූ දෙසැම්බර් මස 18වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

## ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීම හෝ බදුගැනීමට දෙන ඉල්ලුම්පත්‍ර.

වයඹ දිසාවේ ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීමට ඉල්ලුම්පත්‍ර සම්බන්ධ ඉඩම් මැනීමේ පිළිවෙල මෙසේයි:—

1. වයඹ දිසාවේ ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීමට හෝ බදුගැනීමට ඉල්ලුම්පත්‍ර සම්බන්ධ මැනීම මෙහි පහත පෙනෙන පිළිවෙලට මීටපසු කරණුලැබේ.

2. එම දිසාව කොට්ඨාස තුනකට බෙදනලදී, එනම්:— නොම්මර 1න් කොට්ඨාසය, කුරුණෑගල දිස්ත්‍රික්කය. නොම්මර 2න් කොට්ඨාසය, හලාවත දිස්ත්‍රික්කය. නොම්මර 3න් කොට්ඨාසය, පුත්තලම් දිස්ත්‍රික්කය.

3. ඉහත කියනලද පළමුවෙනි කොට්ඨාසයට අයිති ඉඩම් මැනීමට ඉල්ලුම්පත්‍ර වර්ෂ 1924ක්වූ පෙබරවාරි මස 1වෙනි දින පටන් (දෙවනු දන්වනතුරු) සර්වෙයර් ජනරල් උන්නාන්සේට යවන්නේ නැත. ඒ කොයිහැටිවුනත් කච්චේරියේ සටහන්කර තිබීමට සහ විකිනීමට හෝ බදුදීමට බාධාවක් ඇද්ද යන වග දැනගැනීම පිණිස යමෙක් ඉඩම් ඉල්ලුම්කරන්ට කැමතිනම් එසේ කළහැක.

4. මැනීම සම්බන්ධ ඉල්ලුම්පත්‍ර ඊලඟට යවන්නේ නැත්තේ දෙවෙනි සහ තුන්වෙනි කොට්ඨාස සම්බන්ධවයි. මේ කොට්ඨාස දෙකේ ඉඩම් මිලේට ගැනීමට හෝ බදුගැනීමට ඉල්ලුම්පත්‍ර හැකි පමණ ඉක්මනින් පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ වෙත යැවිය යුතුයි.

5. දෙවෙනි සහ තුන්වෙනි කොට්ඨාසය සම්බන්ධ මැනීමට ඉල්ලුම්පත්‍ර යැවීම නවත්වනු ලබන දිනය ලඟදී ප්‍රසිද්ධකරණු ලැබේ. එම දින නම් පළමුවෙනි කොට්ඨාසයේ වැඩ අවසාන වන දිනය වේ.

පී. ඒ. හබ්සන්,
වයඹ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වම්හ.

වර්ෂ 1923ක්වූ දෙසැම්බර් මස 19වෙනි
දින කුරුණෑගල කච්චේරියේදීය.

## නඩුපොත් පුළුස්සාදැමීම සම්බන්ධ දැන්වීම.

කොළඹ දිස්ත්‍රික්උසාවියේ වර්ෂ 1875 සිට වර්ෂ 1876 දක්වා තිබෙන පරණ නඩුපොත් (නොම්මර 68,702 සිට 69,955 දක්වා නඩුපොත්) වර්ෂ 1924ක්වූ පෙබරවාරි මස පළමුවෙනි දිනේ සිට තුන්මසක් ගියපසු වර්ෂ 1894ගේ 12වෙනි ආඥාපනතේ ප්‍රකාරයට පුළුස්සාදමන බව මෙයින් දන්වමි.

යම් කෙනෙකුට මෙයින් යම් නඩුපොතක් පුළුස්සා නොදමා තබාගන්ට ඕනෑනම් ඒ බව තමන්ම උසාවිය ඉදිරියේ පෙනීසිට නොහොත් පෙරකදෝරුකෙනෙක් ලවා නැත්නම් ලියූ අයගේ අත්සන් ඇති පෙත්සමකින් උසාවිය පිළිගන්නා සෑහෙනකරුණු පෙන්වා එය පුළුස්සා නොදමනලෙස ඉල්ලාසිටිය යුතුයි.

වර්ෂ 1923ක්වූ දෙසැම්බර් මස 21වෙනි දින
කොළඹ දිස්ත්‍රික් උසාවියේදීය.

ඩබ්ලිව්. ඇස්. ද සේරම්,
දිස්ත්‍රික් නඩුකාර තැන.

H. ROSS COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.